www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා මිලිටරිය මානුෂ්‍ය ව්‍යසනයක් නිර්මානය කරන තතු තුල සිය ගනනක් මරුමුවට පත් වේ

## Hundreds dead as Sri Lankan military creates humanitarian disaster

**සරත් කුමාර සහ කේ. රත්නායක විසිනි**
**2009 ජනවාරි 28**

බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය විනාශ කර දැමීමේ එල්ලයෙන් යුක්තව ශ්‍රී ලංකා මිලිටරිය ගෙන ප්‍රහාරක මෙහෙයුම, යුද ගැටුමට කොටු වූ ලක්ෂ සංඛ්‍යාත ජනයා සඳහා මානුෂ්‍ය අර්බුදයක් නිර්මානය කර ඇත. මාධ්‍යවේදීන් යුද පෙරමුනු ප්‍රදේශවලට ඇතුලුවීම තහනම් කර ඇති නමුදු, එහි සිට කාන්දු වෙමින් පවතින වාර්තා මගින් පෙන්නුම් කෙරෙන්නේ, සිවිල් වැසියන් සිය ගනනින් මිය ගොස් තවත් බොහෝ සංඛ්‍යාවකට තුවාල සිදු වී හදිසි වෛද්‍ය ආධාරවල අවශ්‍යතාවෙන් පෙලෙන බවයි.

ඉරිදා එල්ටීටීඊයේ අවසන් බල මධ්‍යස්ථානය වන මුලතිව් අල්ලා ගැනීමෙන් පසුව, හමුදාව, දැන් නගරයෙන් උතුරට වන්නට පිහිටි, කිලෝමීටර් 25ක් පමන දිග කිලෝමීටර් 10ක් පමන පලල, ප්‍රදේශයකට සීමා වී ඇති එල්ටීටීඊ සටන්කරුවන් වටා තොන්ඩුව තද කරමින් සිටී. මීට පෙර මාස 30ක් තිස්සේ පැවති සටන්වල දී සිදු වූවාක් මෙන්ම, එල්ටීටීඊය දුර්වල කරනු හා ප්‍රාදේශීය ජනතාව ත්‍රස්ත කරනු පිනිස මිලිටරිය ඉවබවක් නැතිව කාල තුවක්කු ප්‍රහාර හා ගුවනින් බෝම්බ හෙලීම යොදා ගත්තේය.

මෑත දිනවල දී සිවිල් වැසියන් සිය ගනනක් ඝාතනය කෙරී ඇතැයි ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (අයිසීආර්සී) ඊයේ සඳහන් කලේය. මෙම තක්සේරු පදනම් කෙරුනේ අයිසීආර්සී කාර්ය මන්ඩලය ප්‍රාදේශීය රෝහල්වල මෘත ශරීර ගනන් කිරීම මතය. සහන සේවකයන්ට ප්‍රදේශයට ප්‍රවිෂ්ට වීමට දී ඇති ඉඩකඩ ඉතා සීමිත අතර මරන සංඛ්‍යාව මීට වඩා බෙහෙවින් ඉහල අගයක් ගැනීමට ඉඩ ඇත. තුවාල වී අසාධ්‍ය තත්වයෙන් පසුවන 200ක් දෙනා ඉවත් කර ගැනීමට අවසර දීම මිලිටරිය ප්‍රතික්ෂේප කර ඇතැයි අයිසීආර්සී ඊයේ වාර්තා කල අතර හදිසි ප්‍රතිකාර නොමැතිව ඔවුන් මිය යනු ඇතැයි ද අනතුරු ඇඟවීය.

අයිසීආර්සී දකුනු ආසියානු මෙහෙයුම් ප්‍රධානී ජැක්වෙස් ඩි මයිඕ මාධ්‍යවලට මෙසේ පැවසීය: "මිනිස්සු වෙඩි ප්‍රහාරවලට මැදි වෙනවා, රෝහල් හා ගිලන් රථ ෂෙල් ප්‍රහාරවලට ලක් වෙලා තියෙනවා. තුවාලකරුවන් ඉවත් කර ගෙන යද්දී බොහෝ සහන සේවකයන්ට තුවාල සිදු වෙලා. සියල්ල සිදු වී හමාර වෙන කොට, එයට ගොදුරුවූවන් අනේක සංඛ්‍යාවක් සිටින බවත් භයංකර මානුෂ්‍ය තත්වයක් පවතින බවත් අපට දැකගත හැකි වේවි."

හිරවී සිටින සිවිල් වැසියන් පිලබඳව කතා කරමින්, ඩි මයිඕ මෙසේ පැවසීය: "තමන් නිකම්ම වෙඩි ප්‍රහාරවලට ලක්වන බවත් දැඩි ලෙස අනතුරට ලක්විය හැකි බවත් ඔවුන්ට පෙනී යනවා. මේ අවස්ථාවේ වෛද්‍ය සේවාවන්ට ප්‍රවිෂ්ට වීමේ හැකියාවක් නැති තරම්. ඔවුන්ට ආහාර අවශ්‍යයි, ඔවුන්ට සෙවනක් අවශ්‍යයි. ඔවුන් බොහෝ දෙනෙකුට ආරක්ෂාව අවශ්‍යයි." බොහෝ සටන් සිදු කෙරී ඇත්තේ "යුද නීතියේ මූලික නියමයන්ට මුලුමනින් ම ගරු කිරීම සමග අතිමූලික වසයෙන් නොගැලපෙන" ලෙස යයි ඔහු පැවසීය.

මුලිතිව් දිස්ත්‍රික්කයේ "ආරක්ෂිත කලාපයක්" තහවුරු කරනු පිනිස අයිසීආර්සී මිලිටරිය හා එල්ටීටීඊය සමග සාකච්ඡා කර තිබුනු නමුත් එම ප්‍රදේශය ප්‍රහාරවලින් බේරී නැත. ආරක්ෂිත ප්‍රදේශය මේ වන විට දෙවරක් ප්‍රහාරයට ලක්ව ඇතැයි ඉන්ඩිපෙන්ඩන්ට් අද වාර්තා කලේය. එහි දී 20ක් පමන ඝාතනයට ලක්ව ඇතැයි එක්සත් ජාතීන්ගේ සේවකයෝ වාර්තා කලහ.

ඊයේ කොලඹ සිට කතා කරමින්, එක්සත් ජාතීන්ගේ ප්‍රකාශක ගෝර්ඩන් වෙයිස් මෙසේ පැවසීය: "මෙය බැරෑරුම් අර්බුදයකි. අපගේ කාර්ය මන්ඩලය සිටියේ නම් කරන ලද ආරක්ෂිත කලාපය තුලයි. එම ප්‍රදේශයට කාල තුවක්ක ෂෙල් ප්‍රහාර එල්ල වුනා. එම ෂෙල් ප්‍රහාරවලින් දුසිම් ගනනක් මරනයට හා තුවාලවලට ලක් වුනා. සඳුදා උදේ එල්ල වූ අවසන් ප්‍රහාරයෙන් 10ක් ඝාතනයට ලක්ව තවත් බොහෝ ගනනකට තුවාල සිදු වුනා. මෙය ඔවුන්ම අත්දැකපු දෙයක්."

සෙනසුරාදා සහ ඉරිදා ෂෙල් ප්‍රහාර එල්ල වීමෙන් පසුව "ආරක්ෂිත කලාපය" තුල සිටි සිය සහන සේවකයන් විසින් එවන ලද එක්සත් ජාතීන්ගේ සිහිකැඳවුමක් අද *නිව් යෝර්ක ටයිම්ස්* පත්‍රය විසින් උපුටා දක්වන ලදි. "ෂෙල් ප්‍රහාරය පැමිනියේ ශ්‍රී ලංකා මිලිටරිය වෙතින් බවට එම භූමියේ සිටි අපගේ කන්ඩායමට කිසිදු සැකයක් නැත. එහෙත් එය එල්ටීටීඊ ෂෙල් ප්‍රහාරයකට ප්‍රතිචාර වසයෙන් එල්ල කෙරුනක් ලෙස පෙනී යයි. ඔවුන් වටේටම දක්නට ලැබුනේ මිය ගිය හා තුවාල ලැබූ මිනිසුන් ය. එක්සත් ජාතීන් සමීපයේ සිටි බැවින් තමන් ආරක්ෂාකාරී යයි එම මිනිසුන් සිතන්ට

ඇත. කනගාටුදායක ලෙස එදා රාත්‍රියේ ඔවුන්ට වැරදුනි." යයි එය සඳහන් කලේය.

අර්බුදය පිලිබඳ මාධ්‍ය ආවරනය සපයන්නේ දල විස්තරයකි. 2006 ජූලි මස දී එල්ටීටීඊයට එරෙහිව යුද්ධය යලි දියත් කල අවස්ථාවේ පටන්, ආන්ඩුව හා මිලිටරිය සටන් පවතින ප්‍රදේශවලට ඇතුලුවීම මාධ්‍යවේදීන්ට තහනම් කොට හමුදා මෙහෙයුම්වලට පක්ෂපාතී නොවන සියලු ප්‍රවෘත්ති වාරනය කිරීමකට සමාන වන තත්වයක් පැනවීය. මිලිටරිය හා ආන්ඩුව සම්බන්ධයෙන් යන්තම් විවේචනශීලී වන මාධ්‍යවේදීන් පවා මිලිටරියේ අනුග්‍රහය ලබන ඝාතක කල්ලි විසින් තර්ජනයන්ට, පැහැරගැනීම්වලට හා ඝාතනයන්ට ලක් කෙරී තිබේ.

මිලිටරිය පුරුද්දක් වසයෙන් ජනඝාතන පිලිබඳ චෝදනා ප්‍රතික්ෂේප කරන අතර, ඊශ්‍රායල සන්නද්ධ හමුදා මෙන් ම, "මිනිස් පලිහක්" ලෙස සිවිල් වැසියන් යොදා ගන්නේ යයි එල්ටීටීඊයට බැන වදී. එහෙත් සිවිල් වැසියන් ඉලක්ක කර නොගැනීම පිලිබඳ එහි සියලු කියාපෑම් සම්බන්ධයෙන් කිව හැක්කේ, හමුදාව තුල දෙමල විරෝධී වර්ගවාදය ගැඹුරුටම කාවැදී පවතින බව හා එය සමස්තයක් ලෙස දෙමල සුලුතරයම සතුරා ලෙස සලකන බවයි. මිලිටරිය යුද කලාපය වටා මුරකාවල් දමා එයින් පලා යාමට තැත් කරන ඕනෑම අයෙක් ප්‍රශ්න කිරීමට ලක්කොට, එල්ටීටීඊ සැකකරුවකු ලෙස සැලකෙන ඕනෑම අයෙක් රඳවා ගෙන, එම ප්‍රදේශයට ඖෂධ ඇතුලු මූලික මානුෂික සැපයුම් ඇතුලුවීම වලකා ඇත.

සෙසු වාර්තා මූලික ව්‍යසනයක් පිලිබඳව අවධානය යොමු කරයි. සෙනසුරාදා මුලතිව් දිස්ත්‍රික් ලේකම් ඉමෙල්ඩා සුකුමාර් බීබීසී සේවයට කියා සිටියේ පසුගිය බ්‍රහස්පතින්දා ඇය ප්‍රදේශයෙන් පිටවීමට පෙර සතිය තුල ෂෙල් ප්‍රහාරවලින් 100 දෙනෙක් පමන ඝාතනය කෙරී ඇති බවයි. පලිගැනීමට ලක්වෙතැයි සැකයෙන් යුක්තව ඇය මිලිටරිය ඒ සම්බන්ධයෙන් වගකිව යුතු යයි පරෙස්සමින් ඇඟවූවාය. හමුදාව වගකිව යුතු ය යන්න ප්‍රතික්ෂේප කල හමුදා ප්‍රකාශක මාධ්‍යවලට කතා කිරීම සම්බන්ධයෙන් සුකුමාර්ව හෙලාදුටුවේය.

සඳුදා ඩේලි මිරර් පත්‍රය මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෛද්‍ය ටී. වර්ධරාජා කල හදිසි ආයාචනයක් වාර්තා කලේය. හදිසි වෛද්‍ය සැපයුම් ඉල්ලා සිටි ඔහු, මල්ටි-බැරල් විදිනයන් වෙතින් එල්ල කෙරනු රොකට් ප්‍රහාර මගින් මිනිසුන් 300කට වඩා ඝාතනයට ලක්ව තවත් බොහෝ සංඛ්‍යාවකට තුවාල සිදුව ඇතැයි පැවසීය.

රජයේ වෛද්‍ය නිලධාරියකු වන වෛද්‍ය ටී. සත්‍යමූර්ති අද නිව් යෝර්ක් ටයිම්ස් පත්‍රයට කියා සිටියේ ඔහු උදයර්කට්ටු ගමේ පිහිටුවූ තාවකාලික රෝහල ඉරිදා ෂෙල් ප්‍රහාරවලට ලක්වූ බවයි. එයට ෂෙල් ප්‍රහාරයක් එල්ල වන විට අවතැන්වූ සිවිල් වැසියන් 1000කට වැඩි පිරිසක් රෝහල් භූමියේ සෙවන ලබමින් සිටියේය. සිවු දෙනෙක් ඒ අවස්ථාවේම ඝාතනයට ලක්විය. පසුගිය දින දෙක තුල මල සිරුරු 33ක් රෝහල වෙත ගෙනවිත් ඇති අතර රෝගීන් තිදෙනෙක් රුධිර ගලනයෙන් මිය ගියේය. එහි ශල්‍ය වෛද්‍යවරු නැත.

සිය රෝගීන් 100න් වැඩි පිරිසක් මිය යනු ඇතැයි වෛද්‍ය සත්‍යමූර්ති අනතුරු ඇඟවීය. "ඔවුන්ව ආරක්ෂිත ස්ථානයකට යවන්න අපට සිදු වෙනවා. ඊට පස්සෙයි අපට එතැනින් ඉවත් වෙන්න් පුලුවන් වෙන්නෙ. අවාසනාවකට ප්‍රහාරය තවමත් සිදු වෙනවා. අපි ඉන්නෙ භයංකර තත්වයක. අපි ඉන්නෙ අසරන තත්වයක." යයි ඔහු දුරකතනයෙන් පුවත්පත සමග පැවසීය.

උතුරු ශ්‍රී ලංකාවේ දිගහැරෙන මානුෂ්‍ය ව්‍යසනය එක්සත් ජාතීන්, යුරෝපා සංගමය හා ඉන්දියාව එය පිලිබඳ උත්සුකතා මතු කිරීට පොලඹවා ඇත. එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන් කි-මූන් සඳුදා ප්‍රකාශයක් නිකුත් කරමින්, තමන් "ශ්‍රී ලංකාවේ වන්නි කලාපය තුල උත්සන්න කෙරී ඇති සටන්වලට මැදිවූ සිවිල් ජනයාගේ ආරක්ෂාව හා යහ-පැවැත්ම පිලිබඳව ගැඹුරු ලෙස උත්සුක" වී ඇති බව පැවසීය.

ඉන්දියාවේ විදේශ ඇමති ප්‍රනාබ් මුඛර්ජී ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ආන්ඩුව සමග සාකච්ඡා පවත්වනු පිනිස ඊයේ කොලඹ සංචාරයක යෙදුනේය. "සිවිල් ජනයාට උදව් කිරීමට හා ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීමට" මූලික ප්‍රයත්න ගත යුතු යයි තමන් ඉල්ලා ඇතැයි ඔහු පැවසූ බව ඉන්දියානු මාධ්‍ය වාර්තා කලේය. අසල්වැසි ශ්‍රී ලංකාවේ දෙමල ජනයා මුහුන දෙන ඉරනම සම්බන්ධයෙන් මහජන වෛරය නැගෙන දකුනු ඉන්දියානු තමිල්නාඩු ප්‍රාන්තයේ සිය දේශපාලන සගයන් වෙතින් එල්ල වන වැඩෙන පීඩනයට ඉන්දියානු ආන්ඩුව මුහුන දී සිටී.

මෙම සියලු ප්‍රකාශ මුලුමනින්ම කුහකය. පසුගිය වසර දෙකහමාර තිස්සේ, "ජාත්‍යන්තර ප්‍රජාව" 2002 සටන් විරාමය උල්ලංඝනය කිරීමට හා මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් පාගාදැමීමට ආන්ඩුවට නිහඬව ඉඩ දී තිබේ. ජනාධිපති රාජපක්ෂ සටන් විරාම ගිවිසුම ඉරා දමා, මොන යම් හෝ සාම සාකච්ඡාවක් ප්‍රතික්ෂේප කොට, එල්ටීටීඊය මිලිටරිමය ලෙස විනාශ කර දැමීමට සපථ කල විට, යුරෝපා සංගමය ඇතුලු, ඊනියා සාම ක්‍රියාදාමයේ අනුග්‍රාහකයෝ, එක වචනයකින් වත් විරෝධය දැක්වූයේ නැත. ඉන්දියාව හා එක්සත් ජනපදය යන දෙගොල්ලම, එල්ටීටීඊය සමග සටන් කිරීමට ඔත්තු තොරතුරු, පුහුනුව හා උපකරන සපයමින් ශ්‍රී ලංකා මිලිටරියට සහාය දී ඇත.

සිය වර්ගෝත්තමවාදී යුද්ධය ක්ෂමා විරහිත ලෙස ගෙනයනු වස් මහ බලවතුන්ගේ, අන් කවරෙකුට වත්

වඩා එක්සත් ජනපදයේ, සහයෝගය තමාට ලැබෙන බව රාජපක්ෂ හොඳින් දනී. 2006 දී ආක්‍රමනික මෙහෙයුම් යලි ඇරඹීමෙන් පසුව, මිලිටරිය මුලින් ම නැගෙනහිර පලාතේ එල්ටීටීඊ බල මධ්‍යස්ථාන සියල්ලම අල්ලා ගත් අතර, ඉන් අනතුරුව උතුරු පලාත වෙත සිය බලවේග සංකේන්ද්‍රනය කලේය. මාස ගනනාවක දරුනු සටන්වලින් පසුව, හමුදාව ජනවාරි 2 දා එල්ටීටීඊ පරිපාලන මධ්‍යස්ථානය වන කිලිනොච්චිය අල්ලා ගත් අතර, ඉන් පසුව ඉක්මනින් ම උතුරේ යාපන අර්ධද්වීපයට ඇතුලු වන දොරටුව වන මූලෝපායික අලිමංකඩ ද මුලතිව් ද අල්ලා ගත්තේය.

"ත්‍රස්තවාදීන් ගෙන් උතුර" මුදාගැනීම් ප්‍රජාතන්ත්‍රවාදය, සාමය හා සෞභාග්‍යය ගෙන එනු ඇතැයි රාජපක්ෂ කියාපායි. කෙසේවෙතත්, කොලඹ අනුප්‍රාප්තික ආන්ඩු, දෙමල සුලුතරයේ ද සමස්තයක් ලෙස කම්කරු පන්තියේ ද වියදමින්, සිංහල ප්‍රභූන්ගේ දේශපාලන හා ආර්ථික අධිපතිභාවය තහවුරු කරගනු පිනිස, 25 වසරක යුද්ධයක් ගෙනගොස් තිබේ. මිලිටරි ජයග්‍රහන දිවයිනේ "ජනවාර්ගික ගැටලුව" ලෙස හඳුන්වන දෙය හෝ දෙමල විරෝධී වෙනස්කම් කිරීමේ පිලිවෙත අවසන් කරනු වස් කිසිවක් නොකරනු ඇත.

මුලතිව් දිස්ත්‍රික්කයේ සිවිල් ජනයාගේ ජීවිත සම්බන්ධයෙන් පවත්නා පරිපූර්න නොතැකීම, ආන්ඩුවේ සොල්දාදුවන්ගේ ජීවිත ගැන දක්වන පිලිකුලට සමාන්තර වේ. දරිද්‍රතාව හා රැකියා අවස්ථා නොමැතිකම හේතුවෙන් හමුදාවට බැඳීමට බල කෙරී ඇති රටේ දකුනේ සිංහල ප්‍රදේශවල ගම්බද තරුනයෝ මාස තුනක පුහුනුවක් ලබාදීමෙන් පසුව එල්ටීටීඊ ආරක්ෂක වලලු බිඳ දමනු වස් තුවක්කු බත් ලෙස යොදා ගනු ලැබ ඇත.

සිය මාධ්‍ය වාරනයේ කොටසක් ලෙස, මිලිටරිය පසුගිය වසරේ දී, යුද්ධයෙන් සිදු වන ජීවිත හා ශාරීරික හානි පිලිබඳ සංඛ්‍යා ලේඛන නිකුත් කිරීම නතර කලේය. එහෙත්, විරුද්ධ පක්ෂයේ චෝදනාවන්ට ප්‍රතිචාරයක් වසයෙන්, යුද්ධය සඳහා යොදවන ලද සොල්දාදුවන් 50,000කින් 2008 වසරේ අවසන් මාස තුන තුල 3,000ක් ජීවිතක්ෂයට පත්ව ඇති බව, පිලිගැනීමට, ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ලට මේ මස මුලදී බලකෙරුනි. ඊට වැඩි සංඛ්‍යාවක් තුවාල ලබා හා අතපය අහිමි වීමට ලක්ව ඇත.

මේ සතියේ දී හමුදාව මාධ්‍යවේදීන්ට සිය නව තැග්ග ප්‍රදර්ශනය කල විට, සටනේ ස්වභාවය එලිදරව් විය. මිලිටරිය මුලතිව් අවතාර නගරයක් බවට පරිවර්තනය කර ඇත. එහි සිටි 37,000ක් වැසියන් නගරය දෙසට එමින් සිටි හමුදාවට බියෙන් පලා ගොස් ඇති අතර බොහෝ ගොඩනැගිලිවල ෂෙල් ප්‍රහාරවල ලකුනු දක්නට ලැබුනි. මෙහෙයුමේ අනදෙන නිලධාරි, බ්‍රිගේඩියර් නන්දන උඩවත්ත, සිය භටයන්ගේ වීර ක්‍රියා ගැන උදම් අනමින් නගරය වටා උජාරුවෙන් ගමන් කලේ, එහි පවත්නා කාලකන්නි ස්වභාවය ගැන නොතකමිනි.

එල්ටීටීඊය සිය මිලිටරි පරාජයන් පිලිබඳව නිවේදන කිහිපයක් නිකුත් කොට ඇත. පසුගිය සතියේ එල්ටීටීඊ ප්‍රකාශක බී. නඩේසන් බීබීසී සේවයට මෙසේ පැවසීය: "විමුක්ති යුද්ධයක දී හමුදාවකට භූමි ප්‍රදේශ අහිමි වීම, එය නැවත ජය ගැනීම හා නිදහස අත්පත් කර ගැනීම සාමාන්‍ය දෙයක්. . . . අතීතයේ දී අපි බොහෝ වතාවක් පසුබැහලා තියෙනවා, යලි පහර දී දැවැන්ත ජයග්‍රහන අත්පත් කරගෙන තියෙනවා," කෙසේවෙතත්, එල්ටීටීඊයට සිය ප්‍රධාන බල මධ්‍යස්ථාන සියල්ලම ද සිය පොදු කාර්ය ව්‍යුහයෙන් හා බර ආයුධවලින් විශාල කොටසක් මෙන් ම දකුනු ඉන්දියාවේ හා ආසියාවේ සෙසු ප්‍රදේශවල සිට පැවති එහි සැපයුම් මාර්ග ද අහිමි වී තිබේ.

කෙසේවෙතත්, එල්ටීටීඊයේ බිඳවැටීම ගලා එන්නේ, මූලිකව ම මිලිටරි හේතු වෙතින් නොව දේශපාලනික හේතු වෙතිනි. ශ්‍රී ලංකාවේ උතුරේ හා නැගෙනහිර වෙනම ධනපති රාජ්‍ය කැබැලිත්තක් පිලිබඳ එහි ඉදිරිදර්ශනය, දෙමල කම්කරුවන්ගේ හා ගොවීන්ගේ නොව, දෙමල ධනේශ්වර කොටස්වල අවශ්‍යතා නියෝජනය කල අතර, එය පාදක වූයේ මහ බලවතුන්ගේ සහාය පතා ආයාචනා කිරීම මතය. "ජාත්‍යන්තර ප්‍රජාව" විසින් හුදකලා කරනු ලැබ, එල්ටීටීඊයට, ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමේ හැකියාව සහිත එකම සමාජ බලවේගයට -- කම්කරු පන්තියට -- මොනම ආයාචනයක් වත් කිරීමට ඓන්ද්‍රීයව නොහැකි විය. ඒ වෙනුවට, එය කොලඹ දේශපාලන සංස්ථාපිතය විසින් ගෙනයනු ලබන සාපරාධී යුද්ධය සම්බන්ධයෙන් සිංහල කම්කරුවන්ට දෝෂාරෝපනය කලේය.

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය, යුද්ධය නතර කිරීමට හා ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීමට, ඔවුන්ගේ පොදු පන්ති අවශ්‍යතා සහ සමාජවාදී ක්‍රියාමාර්ගයක් වටා, කම්කරුවන් -- සිංහල, දෙමල හා මුස්ලිම් -- ඒකාබද්ධ කරනු පිනිස පලාත් සභා මැතිවරන තුල මේ දැන් උද්ඝෝෂනයක යෙදී සිටී. දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමය කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් වෙනුවෙන් ඒකාබද්ධ අරගලයක් සඳහා දේශපාලන කොන්දේසි තහවුරු කරනු පිනිස, උතුරෙන් හා නැගෙනහිරෙන් සියලු ආරක්ෂක හමුදා වහාම හා කොන්දේසි විරහිතව ඉවත්කරන ලෙස සසප ඉල්ලා සිටී. රාජපක්ෂ ආන්ඩුවේ ප්‍රතිගාමී යුද්ධයට විරුද්ධ සියලු දෙනාගෙන් ම අප ඉල්ලා සිටින්නේ සසප උද්ඝෝෂනයට සහයෝගය දෙන ලෙසයි.

© www.wsws.org